## CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


# සංගමනශීලීත්වය ක්‍රියාත්මක කිරීමේ අදියර ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ එඬේරික ලිපිය

## "ශ්‍රාවකයෝ සමිඳාණන් වහන්සේ දුටු කල ප්‍රීතියෙන් පිනා ගියහ" (ජොහාන් 20:20)

අප පාස්කු සමය ගත කරන මේ මොහොතේ, ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුව උත්ථාන වූ සමිඳාණන් වහන්සේ මුණගැසීමේ ප්‍රීතිමත් සෙනෙහසින් යුතුව ඔබට සුබාශිංසන පිරිනමන්නේය. 2026 මැයි 01 දින පැවැත්වෙන, කම්කරු ශුද්ධවූ ජුසේ මුනිඳුන්ගේ මංගල්‍යය, ශ්‍රී ලාංකේය කතෝලික සභාව තුළ සංගමනශීලීත්වය ක්‍රියාත්මක කිරීමේ අදියර ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ඔබ සැම ඇමතීමට අවස්ථාවක් සපයයි.

01. කිතුනුවන් බෞතිස්මය ලබා ඇත්තේ දූත මෙහෙවරක් වෙනුවෙනි. අපි නාමමාත්‍රික කිතුනුවන් නොවෙමු. "බෞතිස්ම ස්නාපනය ලද සියලු දෙනාම දූත මෙහෙවරට සම්බන්ධය" (සංගමනශීලී සභාවක් සඳහා, අවසාන ලේඛනය (FD), 66). "දේශීය සභාවන් පිහිටා තිබෙන පරිසරයන්ගේ බහුවිධතාව තුළ දේව ජනතාව, ගැලවීමේ සුබාරංචිය ප්‍රකාශ කරන අතර, එයට සාක්ෂි දරයි" (FD 1.7). දේව ජනතාව ලෙස, "ආත්මයාණන් වහන්සේ සභාවලට වදාරණ දේ...." (එළිදරව්ව 2:7) වත්මන් යුගයේ දී පැහැදිළිව අවබෝධ කර ගැනීමට අපට ඇරියුම් කෙරේ. මෙම විචාර බුද්ධිය, සමිඳාණන් වහන්සේව අත්විඳීමට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයින් ලෙස ප්‍රීති වීමටත් අපට මග පෙන්වයි;
"ශ්‍රාවකයෝ සමිඳාණන් වහන්සේ දුටු කල ප්‍රීතියෙන් පිනා ගියහ" (ජොහාන් 20:20).

02. මෙම මෙහෙවර ඉටුකිරීම සඳහා ලොව පුරා සාන්ත සභාව "සංගමනශීලි සභාවක් සඳහා, සාංඝිකත්වය, සහභාගිත්වය, දූත සේවාව" යන තේමාව යටතේ, සාන්ත සභාව බවට පත්වීමේ සංගමනශීලී මාර්ගයට අවතීර්ණ වී තිබේ. මෙය " ප්‍රීතියට ද සමිඳාණන් වහන්සේව අනුගමනය කිරීමෙන්, උන්වහන්සේගේ දූත සේවයට කැපවීමෙන් සහ විශ්වාසවන්ත වීම සඳහා මාර්ග සොයා යාමෙන් සාන්ත සභාව නවතාවයකට ගෙන ඒමට " (FD 3) ලැබෙන කැඳවීමකි.

03. සංගමනශීලීත්වය සාන්ත සභාවේ අවසාන ඉලක්කය නොවේ. නමුත්, එය ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ, ක්‍රිස්තුන් වහන්සේ, සාන්ත සභාව වෙත පවරා දුන් දූත සේවාවට සේවය කරන්නේය (FD 32). "දූත සේවාව කෙරෙහි නැඹුරු වූ සංගමනශීලිත්වයෙහි, අන්‍යෝන්‍ය ඇහුම්කන් දීම සංවාදය සහ සාංඝික සියුම් අවබෝධය සඳහා සාන්ත සභාවේ සියලු තරාතිරම් එකට රැස්කිරීම..... සරලව සහ සංක්ෂිප්තව කිවහොත්, සංගමනශීලිත්වය යනු ආධ්‍යාත්මිකත්වය අලුත් කිරීමේ සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයේ මාවතක් වන අතර, එමගින් සාන්ත සභාවට වඩාත් සහභාගිත්වය සහිත සහ ධර්මදූතික සභාවක් වීමට හැකියාව ලැබෙන අතර එමගින් ක්‍රිස්තුන් වහන්සේගේ ආලෝකය විහිදුවමින්, සැම පුරුෂයකු සහ ස්ත්‍රියක සමගම එකට එක්ව ගමන් කළ හැකිය" (FD 28).

# CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


4. 2021 ඔක්තෝබර් මාසයේ දී අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් විසින් දියත් කරන ලද මෙම සංගමනශීලි ගමන, ක්‍රියාත්මක කිරීමේ තුන්වන අදියර කරා එළැඹ තිබේ. අති උතුම් XIV වන ලියෝ ශුද්ධෝත්තම පියතුමන්ගේ අනුමැතිය ඇතිව, සමුච්ඡිත සමුළු මහ ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති, සම්මුච්ඡිත සමුළුවේ ක්‍රියාත්මක කිරීමේ අදියර සඳහා මාර්ග 2025 - 2028 නමැති ලේඛනයේ අරමුණ වී ඇත්තේ, 2028 ඔක්තෝබර් මාසයේ දී පළමු වරට පැවැත්වීමට නියමිත සාන්ත සභා සම්මේලනය සඳහා සූදනම් වීම පිණිස සමස්ත සාන්ත සභාවට ම එකට එක්ව ගමන් කිරීමට සහ දේශීය සභා අතර සංවාදය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය පොදු රාමුවක් සැපයීමය.
(Path ways, P.5). එය සෑම දේශීය සභාවක් තුළම (රදගුරු පදවි සහ මීසම් යන ද්විත්වයම) ඒවායේ එදිනෙද පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය තුළ සංගමනශීලි ලෙස කටයුතු කිරීම සඳහා සංස්කෘතියත්, ජීවන රටාවත් ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ගෙන ඇත.

5. මෙම අදියරෙහි අරමුණු වන්නේ ''සාන්ත සභා ජීවිතය වඩාත් සංගමනශීලි බවට පත් කරන නව පිළිවෙත් සහ ව්‍යුහයන් පරීක්ෂා කිරීමයි'' (Path ways, P.7). මෙය රෝමයෙන් ලද ඉල්ලීමක් හෝ ක්‍රියාකාරකම් මාලාවක් හෝ නොව ''සභාවේ විවිධ සන්දර්භයන් තුළ ප්‍රායෝගික සංගමනශීලි පරිවර්තනයක් ඇති කිරීම සඳහා පුහුණුකිරීමේ මාර්ග හඳුනා ගැනීමට'' (එම) දේශීය සභාවන්ට කරනු ලබන ආරාධනයකි. එය සරලව සහ ප්‍රායෝගිකව, දෙවන වතිකාන කතිකාව, එහි ''ජාතීන්ගේ ආලෝකය'' (Lumen Gentium) නමැති ලේඛනයෙන් ඉගැන්වූ දේ ක්‍රියාවට නැංවීමට කරනු ලබන කැඳවීමකි.

6. විශේෂයෙන් රදගුරු පදවියේ රදගුරුතුමන්ගේ නායකත්වය සහ විචක්ෂණශීලිත්වය යටතේ එතුමන්ගේ රැකවරණයට බාර දී ඇති දේව ජනතාව සමග ඉදිරියට යාමට නිදහස ලබා දෙමින් (Pathways, p 9) ක්‍රියාත්මක කිරීමේ අදියරේදී පහත සඳහන් ක්ෂේත්‍රයන්හි ප්‍රගතිය අපේක්ෂා කෙරේ. (Pathways, p20).

එහෙයින් අපි පහත සඳහන් ප්‍රායෝගික ක්ෂේත්‍ර තෝරාගෙන ඇත්තෙමු.

අ). පදවියේ රදගුරු තුමන් යටතේ රදගුරු පදවි සංගමනශීලී කණ්ඩායම් ස්ථාපිත කිරීම (Pathways, PP 9-12)

ආ.) විශේෂයෙන් පදවියේ රදගුරුතුමන්ගේ මග පෙන්වීම යටතේ සමස්ත ක්‍රියාවලියම සජීවිකරණය කරනු ලබන රදගුරු පදවි සංගමනශීලි කණ්ඩායම විසින් අවසාන ලේඛනය සම්පූර්ණයෙන් අධ්‍යයනය කිරීම (Pathways P.7).

ඇ.) ''ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සංවාදය'' මෙවලමක් ලෙස ගනිමින් සංගමනශීලි අධ්‍යාත්මිකත්වය ප්‍රවර්ධනය කිරීම (අවසාන ලේඛනය 43 - 46). ''ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සංවාදය'' අපට සවන් දීමට නිහතමානිත්වය ද ප්‍රකාශනයේ නිදහස ද සංවාදයට විවෘත වීම ද ලබා දෙයි. සමිඳාණන් වහන්සේට සහ උන්වහන්සේගේ ජනතාවට කරනු ලබන සේවයේ සෑම අංශයකින් ම සහ ක්ෂේත්‍රයකින් ම සංගමනශීලිත්වයෙන් පැවතීම සඳහා වන ඉදිරි මාර්ගය මෙය පමණකි.

ඈ). බෞතිස්මය ලැබූවන් (පූජ්‍ය පක්ෂය සහ ගිහියන් යන දෙඅංශයෙන් ම) ලෙස වගකිව යුතු තනතුරු හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම, කුඩා කිතුනු සංසයන් පිළිබඳ අපගේ ප්‍රමුඛතාවය තහවුරු කළ යුතුය. (අවසාන ලේඛනය 60,75-77).

# CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


ඉ) පදවි සහ මීසම් මට්ටමින් සාන්ත සභා විචක්ෂණශීලී තීරණ ගැනීම, සංගමනශීලී ආකාරයෙන් තීරණ ගැනීමේ ක්‍රියාපිළිවෙළ ක්‍රියාත්මක කිරීම (අවසාන ලේඛනය 93-94) විනිවිදභාවය, වගවීම සහ ඇගයීමේ සුදුසු ආකාරයන් ගවේෂණය කිරීම සහ දියුණු කිරීම (අවසාන ලේඛනය 95 -102).

ඊ) වෙන් කොට හඳුනාගන්නා ලද සහ වගකීම් ප්‍රවර්ධනය කිරීම සඳහා නීතියෙන් සපයා ඇති සහභාගිත්ව ආයතන (පදවි සමුච්ඡිත සමුළුව, පදවි පූජක සමුළුව, පදවි ධර්ම සේවා සභාව, මීසම් ධර්ම සේවා සභාව, පදවි සහ මීසම් මූල්‍ය කමිටුව) පදවි සහ මීසම් තුළ පවත්වා ගෙන යාමට ද සංගමනශීලි ක්‍රමයකින් ඒවායේ මෙහෙයුම් අලුත් කිරීමට ද ඇති වගකීම (අවසාන ලේඛනය 103-106).

උ) සංගමනශීලී සහ ධර්මදූතික ස්ප්‍රීතුවක් තුළ මීසම් නවෝදය ඇති කිරීම (අවසාන ලේඛනය 117). එපමණක් නොව, ශ්‍රී ලංකාවේ බහු - ආගමික, බහු - වාර්ගික සහ බහු - සංස්කෘතික සන්දර්භය තුළ, සාන්ත සභාවේ සෑම මට්ටමකම "ජීවිත සංවාදය" ඔස්සේ සාක්ෂි දරන සංඝයන් බවට පත්වීමට අපි උත්සාහ දැරිය යුතු වෙමු.

ඌ) ක්‍රිස්තියානි මුල් පියවරේ ගමන් මගෙහි (අවසාන ලේඛනය 142) සහ පොදුවේ පුහුණු වැඩසටහන්වල සහ ඒවාට කැපවී ඇති ආයතනවල ද සංගමනශීලී ගති ලක්ෂණ පිරික්සා බැලීම (අවසාන ලේඛනය 143 - 151). විශේෂයෙන්, පූජකවරය අපේක්ෂිත දෙව්සත්හල් සිසුන්ගේ සහ පැවිදි ජීවිත අපේක්ෂකයින්ගේ පුහුණුවට සංගමනශීලී සංස්කෘතිය හඳුන්වා දිය යුතුය.

7.) 2025 මැද භාගයේ දී ආරම්භ වූ වත්මන් ක්‍රියාත්මක කිරීමේ අදියර 2026 අවසානය දක්වා විහිදෙන අතර, 2027 වසරේ පළමු භාගය රදගුරු පදවි මට්ටමින් සිදු කෙරෙන ඇගයීම් සමුළු සඳහා කැප කර තිබේ. 2027 දෙවැනි භාගය ජාතික සහ රදගුරු සමුළු ඇගයීම් සඳහා කැප කර ඇති අතර, 2028 වසර මහද්වීපික මට්ටමේ අගැයීමට සහ වතිකානයේ දී සාන්ත සභා සමුළුව පැවැත්වීමට අපව යොමු කරනු ඇත.

8.) "සංගමනශලී සභාවක් ලෙස වර්ධනය වීම පිණිස අවශ්‍ය දැනුම ලබා ගත හැක්කේ අත්දැකීම් තුළින් පමණක් වන අතර එය සමිඳාණන් වහන්සේ සමග සිදුවන සම්මුඛ වීමකට අපව හඳුන්වා දෙයි (Pathways p.8)' මුළු මහත් සංගමනශීලී ගමනේ ම අරමුණ වන්නේ ජෙරුසලෙම් සංඝයේ පළමුවන සංගමනශීලී සිදුවීමේ අත්දැකීම "එය යහපතැ යි සමිඳාණන්ටත් අපටත් පෙනී ගියේය."(ක්‍රියා 15:29) යන වචන භාවිත කරමින් තහවුරු කිරීමයි (අවසාන ලේඛනය 81).

9.) මෙම සංගමනශීලී ගමනේ පූර්වාදර්ශය වන්නේ දෙවියන් වහන්සේගේ ද සාන්ත සභාවේ සහ මිනිස් සංහතියේ ද මාතාව වන, අපගේ,භාග්‍යවත් කන්‍යා මරිය මාතාවන් ය. "එතුමිය වනාහි ඇහුම්කන් දෙන යාච්ඤා කරන, මැදිහත් වන, සංවාදයෙහි යෙදෙන, එක්ව ගමන් කරන, විචක්ෂණශීලීව සිතන, තීරණ ගන්නා සහ ක්‍රියා කරන සාන්ත සභාවේ හැඩය වන්නීය. සවන් දීමේ කලාව ද දේව කැමැත්තට අවධානය යොමු කිරීම ද, දේව වචනයට කීකරු වීම ද දුප්පතුන්ගේ අවශ්‍යතාවන්ට සවන් දීමට සහ මග ඔස්සේ ගමන් කිරීමට ඇති සූදානම ද අපි එතුමියගෙන් ඉගෙන ගනිමු" (අවසාන ලේඛනය 29).

# CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


10) ශ්‍රී ලංකාවේ කතෝලික රදගුරු හිමිවරුන් ලෙස, බෞතිස්ම ස්නාපනයෙන් අප ලද අපගේ හවුල් මෙහෙවර ඉටු කිරීම සඳහා සංගමනශීලී ආධ්‍යාත්මිකත්වය සහ සාන්ත සභාව බවට පත්වීමේ සංගමනශීලී ක්‍රමය සහතික කර ප්‍රවර්ධනය කරන්නෙමු. මිදුම්කරුවාණන් වන ක්‍රිස්තුන් වහන්සේ විසින් සාන්ත සභාවට පවරා දී ඇති සුභාරංචි ජීවන රටාවේ අර්ථය සොයා ගැනීම සඳහා විවිධාකාර වූ වගකීම් සමග අත්වැල් බැඳගන්නා ලෙස අපි සියලුම සැදූහැවතුන්ට, පූජා ප්‍රසාදිතුමන්ට, පැවිදි සොයුරු සොයුරියන්ට සහ ගිහි ජනතාවට ඇරියුම් කරමු.

ලංකාවේ අප ස්වාමිදූ වන මරිය මාතාවන් මෙම ගමනේ දී අප සමග ගමන් කරත්වා.
ශ්‍රී ලංකාවේ අපෝස්තුලුවරයාණන් වන ශුද්ධවූ ජුසේ වාස් මුනිඳුනි, ශ්‍රී ලාංකේය සාන්ත සභාව බවට පත්වීමේ සංගමනශීලී මාර්ගයේ දී අපට පූර්වාදර්ශයක් වූව මැනව.

සමිඳාණන් වහන්සේ තුළ ලැදි

✠ අති උතුම් හැරල්ඩ් ඇන්තනි හිමිපාණෝ
කුරුණෑගල රදගුරු
සභාපති
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය

✠ අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ
කොළඹ අගරදගුරු

✠ අති උතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ
ගාල්ල රදගුරු
සංගමනශීලීත්වය පිළිබඳ කටයුතු භාර රදගුරු

✠ අති උතුම් ජස්ටින් ඥානප්‍රගාසම් හිමිපාණෝ
යාපනය රදගුරු

✠ අති උතුම් ඇන්ටන් රංජිත් හිමිපාණෝ
මඩකළපුව අපෝස්තලික පරිපාලක
මහා ලේකම්
ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය

✠ අති උතුම් නොයෙල් එම්මානුවෙල් හිමිපාණෝ
ත්‍රිකුණාමලය රදගුරු
උප සභාපති - ශ්‍රී ලංකා රදගුරු සම්මේලනය

✠ අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ
මහනුවර රදගුරු

✠ අති උතුම් ජූඩ් නිශාන්ත සිල්වා හිමිපාණෝ
බදුල්ල රදගුරු

## CATHOLIC BISHOPS' CONFERENCE IN SRI LANKA

Lankarama, 19, Balcombe Place, Colombo - 08, Sri Lanka.

Tel. No : 0094-11- 2697062 / 2697110
Fax.No : 0094-11- 2699619
E-mail : EpiscopalSL@gmail.com


✠ අති උතුම් විමල් සිරි ජයසූරිය හිමිපාණෝ
හලාවත රදගුරු

✠ අති උතුම් ඇන්ටන් වයමන් ක්‍රෑස් හිමිපාණෝ
රත්නපුර රදගුරු

✠ අති උතුම් අන්තෝනිපිල්ලේ ඥානප්‍රගාසම් හිමිපාණෝ
මන්නාරම රදගුරු

✠ අති උතුම් සාගර ජයමාන්න දි.ස.නි හිමිපාණෝ
අනුරාධපුර රදගුරු

✠ අති උතුම් මැක්ස්වල් සිල්වා හිමිපාණෝ
කොළඹ සහයක රදගුරු

✠ අති උතුම් ජේ. ඩී. ඇන්තනි ජයකොඩි හිමිපාණෝ
කොළඹ සහයක රදගුරු